www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීන කම්කරු පන්තිය මතුවෙයි

## The Chinese working class emerges

2010 ජූනි 05

පසුගිය සති කීපය පුරා චීනය තුල කම්කරුවන්ගේ අරගල රැල්ලක් මතුවී ඒම ජාත්‍යන්තර කම්කරු පන්තිය සම්බන්ධයෙන් ගත් කල දැවැන්ත වැදගත් කමක් දරයි. නිර්ධන පන්තිය විප්ලවවාදී සමාජ බලවේගයක් නොවේයැයි ද පන්ති අරගලය පැරැනි හිස් වැසුමක් යැයිද ප්‍රකාශ කලවුනට විපරීතව ග්‍රීසියෙන් ඇරඹුනු වැඩ වර්ජන රැල්ල දැන් චීනය දක්වා ගමන් කරමින් එහි කම්කරු පන්තිය ප්‍රථම වරට පුපුරා යාමෙන් ලොව පුරා පාලක ප්‍රභූන් සලිත වී ඇත.

සංගතයේ සමස්ත නිශ්පාදන ක්‍රියාකාරිත්වය සති දෙකකට ආසන්න කාලයක් අක්‍රීය කරමින් දකුනු චීනයේ හොන්ඩා සම්ප්‍රේෂන කම්හලේ කම්කරුවන් ගෙන ගිය වර්ජනය ජාත්‍යන්තර මූල්‍ය මාධ්‍යයන් තුල සැලකිය යුතු අවධාරනයකට ලක්විය. ආන්ඩුවේ බිය වැද්දීම් හා රාජ්‍ය-ධාවිත වෘත්තීය සමිතිවල සහ කලමනාකාරිත්වයේ බලපෑම් නොතකා අරගලයේ යෙදී සිටි කම්කරුවන්, ප්‍රධාන වශයෙන්ම තරුන කම්කරුවන්, නැවත සේවයේ යෙදුනේ සැලකිය යුතු වැටුප් වැඩි වීමක් ප්‍රදානය කිරීමෙන් අනතුරුවයි.

හොන්ඩා වැනි ප්‍රධාන සංගතයන් බලගතු ලෙස යැපෙන්නේ චීනය තුල දැඩි ලෙස මර්දනය කොට "විනය ගත" කෙරුනු ලාභ ශ්‍රමයෙන් සූරා ගැනෙන අධි-ලාභයෙනි. 2007-2008 තුල පුපුරා ගිය ගෝලීය මූල්‍ය අර්බුදය මගින් ජාත්‍යන්තර ප්‍රාග්ධනයේ චීනය මත රඳා පැවැත්ම විශාලිත කෙරින.

දස ලක්ෂ සංඛ්‍යාත චීන කම්කරු පන්තියේ කවර හෝ නැගිටීමක් ඍජුව තර්ජනය කරනු ලබන්නේ සංගත ලාභයට පමනක් නොව එවන් නැගිටීමක් අනිවාර්යයෙන්ම ලෝක ආර්ථිකය හා මූල්‍ය පද්ධතිය සිසාරා ප්‍රතිරාව වනු ඇත.

ඩෙල් සහ ඇපල් වැනි ප්‍රධාන ගෝලීය සංගතයන්ට ඉලෙක්ට්‍රොනික භාන්ඩ නිපදවන ෆොක්ස්කොන් කම්හලෙහි සියදිවි නසා ගැනීම් රැල්ල කෙරෙහි වූ මාධ්‍ය අවධානය මගින් චීනය තුල සිදුවන දැවැන්ත පරිමාන නිශ්පාදනය අවධාරනය විය. 400,000 ක සුවිසල් කම්කරු බලකායක් සේවයේ යෙදෙන මෙම කම්හල මත් නගරයක ස්වරූපය ගන්නා අතර හුදෙකලා කෙරුනු මෙම දැවැන්ත නගරය ක්‍රියාත්මක වන්නේ මිලිටරි කඳවුරක් ලෙසිනි. චීන අන්තර්ජාල සංවාද මන්ඩපයක වරෙක මෙසේ සඳහන් විය. "ෆොක්ස්කොන් දෙස බලන විට මගේ මතකයට නැගෙන්නේ චාලි චැප්ලින්ගේ මොඩර්න් ටයිම්ස් චිත්‍රපටයයි. එහි පෙන්වනු ලබන්නේ දැවැන්ත යන්ත්‍රයක දැතිරෝද බවට පිරිහෙලා ඇති මිනිසුන්ගෙන් සමන්විත ලෝකයකි."

පසුගිය දශක තුන තුල මිලියන 120 සිට 400 දක්වා ප්‍රසාරනය වූ චීන කම්කරු පන්තියේ පුපුරනසුලු වර්ධනය පිලිබඳ චිත්‍රයක් කම්කරුවන් මරවා වැඩ ගන්නා ෆොක්ස්කොන් කම්හලෙන් සම්පාදනය කෙරෙන අතර කම්හල එකී වර්ධනය පිලිබඳව දැස් විවර කරයි. ෆොක්ස්කොන් කම්හල පිහිටි ෂෙන්සෙන් ප්‍රදේශය 1980 ගනන් වල මුල් භාගය වන විට ධීවර ගම්මානයක් ව පැවති අතර දැන් එය මිලියන දොලහක ජනතාවක් වෙසෙන කාර්මික මධ්‍යස්ථානයකි. ෆොක්ස්කොන් යනු රටේ සුවිසල්ම කම්හල් වලින් එකක් වන අතරතුර තවත් එවැනිම සුවිසල් කම්හල් ගනනාවක් ෂෙන්සෙන්හි පවතින අතර ඊට අමතරව කුඩා කම්හල් සුවිසල් ගනනකි. එක් නගරයක් එක් තනි නිශ්පාදනයක් සඳහා කැපවුනු නගරයක් ආකාරයට නැගෙනහිර චීනයේ නගරයන් පරිවර්තනය කෙරී ඇත. මෙහිදී "මේස්" නගර, "සපත්තු" නගර, "වායු සමන යන්ත්‍ර" නගර නිර්මානය වී ඇති අතර මේවායේ දස ලක්ෂ සංඛ්‍යාත කම්කරුවෝ සේවයේ යෙදී සිටිති.

කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුවේ අවශ්‍යතාව කම්කරුවෝ ඉවෙන් මෙන් හගිති. හොන්ඩා වැනි කම්හල් වල තරුන කම්කරු බලකාය හැදී වැඩුනේ අන්තර්ජාලය සහ ජංගම දුරකථනත් සමගිනි. ජාත්‍යන්තර සංගතවල දැවැන්ත ලාභයේ උල්පත තම ලාභ ශ්‍රමය බැව් ඔවුහු දනිති. වර්ජකයන් ජාත්‍යන්තර කම්කරු ගීතය ගයන විට එයින් ඇඟවෙන්නේ ලොව පුරා කම්කරු පන්තිය සමාන ප්‍රශ්න වලට සහ පොදු සංගත සතුරන්ට මුහුන දෙමින් සිටිනා බැව් හඳුනාගෙන ඇති බවයි.

හොන්ඩාහි තරුන කම්කරුවන්ගේ ධෛර්යය සහ අධිෂ්ඨානය කිසි විටෙකත් ප්‍රතික්ෂේප නොකරන නමුදු ඔවුන් මුහුන දී සිටින සංකීර්න දේශපාලන ප්‍රශ්න ස්වයංසිද්ධව විසඳෙනු නැත. චීන කොමියුනිස්ට් පක්ෂ (සීසීපී) තන්ත්‍රය තාවකාලික සහන කීපයක් දිය හැක. නමුත් එය කම්කරු පන්තියට වෛරීය ලෙසම හතුරු වන අතර එය රැඳී ඇත්තේ කිසි විටෙකත් භාවිතා කිරීමට

පසුබට නොවන පොලිස් රාජ්‍ය යන්ත්‍රය මතයි. 1949 බලය ලබා ගැනීමේ දී සීසීපී ය මුලින්ම කලේ ප්‍රධාන නගරවල කම්කරු පන්තිය මර්දනය කිරීම සඳහා ගොවි හමුදාවන් යොදා ගැනීමයි.

1989 දී ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහ යහපත් ජීවන තත්වයන් ඉල්ලමින් අරගලයට පිවිසි ශිෂ්‍යයන් හා කම්කරුවන් තලා දැමීම සඳහා බෙයිජින් සහ අනෙකුත් නගරවලට යුද ටැංකි සහ හමුදාවන් යවන ලද අවස්ථාවේ තියනන්මන් චතුරශ්‍රයේ සිදු වූ මහා ජන ඝාතනයේ 21 වන සංවත්සරය ඊයේ දිනට යෙදී තිබුනි. ඔවුනගේ සියලු කිඹුල් කඳුලු තිබියදී, කම්කරුවන්ගේ නොසන්සුන්බව වලකාලීම සඳහා යා හැකි කවර හෝ දුරකට යාමට බෙයිජින් පාලනයේ තිබූ සූදානම ලොව පුරා ආන්ඩු සහ සංගතයන් අවබෝධ කරගෙන සිටියහ. අනතුරුව ඩොලර් බිලියන ගනනින් විදේශ ආයෝජන රට තුලට ගලා ආවේය.

තමා රැඳී සිටින්නා වූ සමාජ කාල බෝම්බය පිලිබඳව සීසීපී තන්ත්‍රය ඉතා සංවේදීය. අතීත සමාජවාදී පූර්ව්ජානම් මුලුමනින්ම පාහේ අත් හල මෙම තන්ත්‍රය අනෙක් රටවල තම සගයන් මෙන්ම කම්කරු පන්තිය බෙදා වෙන් කිරීම සඳහාත් මධ්‍යම පන්තික ස්ථරයන් අතර පදනමක් නිර්මානය කර ගැනීම සඳහාත් නරුම ජාතිකවාදය ප්‍රවර්ධනය කලේය. අතීත චීනය පීඩිත අර්ධ විජිත රටක් බැව් සිහිපත් කරමින් සීසීපී ය තර්ක කරන්නේ චීනය දැන් ලෝකයේ ප්‍රධාන ධනපති බලයන් අතර තමාගේ තැන දිනා ගත යුතු බවයි. සුවිශේෂිතව, එය දැනුවත්වම ජපන් විරෝධී වර්ගවාදය ප්‍රවර්ධනය කොට දිරි ගැන්වීය.

කම්කරු පන්තියට ඉදිරියට යා හැක්කේ සියලුම ආකාරයේ ජාතිකවාදයන් සහ වර්ගවාදයන් ප්‍රතික්ෂේප කරමින් දැනුවත්ව තම අරගලයන් ජාත්‍යන්තර වශයෙන් ඒකාබද්ධ කිරීමෙන් පමනි. චීනයේ හොන්ඩා කම්කරුවන් සහ ජපානයේ තාවකාලික සහ අනියම් කම්කරු බලකායෙන් අති මහත් බහුතරය වන මිලියන සංඛ්‍යාත තරුන "නිදහස් හෝ නොබැඳුනු කම්කරුවන්" මුහුන දෙන කොන්දේසි අතර වෙනසක් නැත. ගෝලීය මූල්‍ය අර්බුදයේ ආරම්භයත් සමග ජපානයේ අපනයන කඩා වැටෙද්දී මෙම නිදහස් කම්කරුවන් දහස් ගනනින් මෝටර් රථ සහ ඉලෙක්ට්‍රොනික කම්හල් වලින් දොට්ට දැමින.

චීන කම්කරු පන්තියට අභිමුඛ වන්නේ හුදෙක් සීසීපීය පමනක් නොවේ. බලගතුම දේශපාලනික අනතුර පැමිනෙන්නේ, කම්කරුවනට සහයෝගීයැයි කියාපාන හා බෙයිජින් තන්ත්‍රයට විරුද්ධ බවක් පෙන්නුම් කරන නමුත්, කම්කරු පන්තියේ කවර හෝ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් පැන නැගීම වලකාලීම සඳහා ක්‍රියා කරන්නවුන්ගෙනි. මේ සම්බන්ධයෙන් ගත් කල බෙයිජින් කම්කරුවන්ගේ ස්වාධීන වෘත්තීය සමිති සම්මේලනයේ [Beijing Workers Autonomous Federation] පිටුවහල් නායක හැන් ඩොන්ග්ෆැන්ගේ සැඳහුම් අර්ථභාරී වන අතර එම සැඳහුම් *ෆිනෑන්ශියල් ටයිම්ස්* හි අවධාරනය කෙරිනි.

1989 තියනන්මන් විරෝධතාව තුල හැන් ප්‍රමුඛ භූමිකාවක් ඉටු කල අතර යහපත් ජීවන තත්වයන් සහ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ඉල්ලීම සඳහා ශිෂ්‍යයන් සමග ඒකාබද්ධවූ කම්කරු ස්ථරයන් අතර යම් බලපෑමක් ඇති කිරීමට ඔහු සමත් විය. හැන්ගේ ඉදිරි දර්ශනය කිසි විටෙක ධනපති ක්‍රමය හෝ චීන තන්ත්‍රය පෙරලා දැමීම සඳහා යොමු වූවක් නොව ඒවා ප්‍රතිසංස්කරනය සඳහා යොමු වූවකි. නවතම වර්ජනය ආරම්භයේදී ඔහු මාධ්‍යන්ට අවධාරනය කලේ කම්කරු අයිතීන් සහ දේශපාලන අයිතීන් එකිනෙකින් වෙන් විය යුතු බවයි. "චීන කම්කරු පන්ති ව්‍යාපාරය නිර්දේශපාලනික කිරීම සඳහා කල හැකි උපරිමය මම කරමින් සිටින්නෙමි" යි ඔහු පැවසීය.

කම්කරු පන්තිය නිර්දේශපාලනික කිරීම යනු එය දේශපාලනිකව නිරායුධ කිරීමයි. සුවිශේෂිතව ඇමරිකානු මාධ්‍යයන් තුල චීනයේ හොන්ඩා වර්ජනය සහ 1930 ගනන් වල ඇමරිකානු මෝටර් රථ කම්කරුවන්ගේ වාඩිලා ගැනීමේ වර්ජන සන්සන්දනය කෙරින. කම්කරු අයිතීන් රැක ගැනීම සඳහා කෙරෙන සටන දේශපාලන අරගලයෙන් වෙන් කිරීමේ ප්‍රති විපාක ඇමරිකානු කම්කරු පන්තියේ එම ව්‍යාපාරය මගින් මනාව පැහැදිලි විය. 1950 ගනන් වල සමාජවාදීන් විරේක කරමින් කම්කරුවන් ඩිමොක්‍රටික් පක්ෂයට යටත් කල ඒඑෆ්එල්-සීඅයිඕ නිලධරය අද දින සංගතයන් විසින් කම්කරුවන් මත අන පනත් පැටවීමේදී විවෘත සංගත ඒජන්තයන් ලෙස ක්‍රියාත්මකවේ.

අනෙක් රටවල මෙන්ම චීනයේද කම්කරු පන්තිය මුහුන දෙන කර්තව්‍යය වන්නේ පසුගිය ශතවර්ෂය පුරා ජාත්‍යන්තර කම්කරු පන්තිය ලද ප්‍රධාන මූලෝපායික අත් දැකීම්වල අත්‍යවශ්‍ය දේශපාලන පාඩම් ඉගෙන ගැනීමයි. සුවිශේෂිතව, ඉන් අදහස් වන්නේ සැබෑ මාක්ස්වාදය සඳහා ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය එහි ඍජු ප්‍රතිවිරුද්ධය වන ස්ටැලින්වාදයට සහ මාවෝවාදයට එරෙහිව ගෙනගිය දිගු කාලීන අරගලය පිලිබඳ ප්‍රවේසම් සහගත අධ්‍යයනයක් අවශ්‍ය බවයි. මතුවෙමින් පවත්නා කම්කරු පන්ති ව්‍යාපාරයේ අත්‍යවශ්‍ය විප්ලවවාදී නායකත්වය ලෙස හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ චීන ශාඛාවක් ගොඩ නැගීම දෙසට තබන ප්‍රථම පියවර එයයි

ජෝන් චැන්

© www.wsws.org